ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.
D.S. Senanayake College, Colombo 07.


තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය
Grade 12

පැය දෙකයි.
Two Hours

# ව්‍යාපාර අධ්‍යයනය - I පත්‍රය
# Business Studies - Paper I

- අංක 01 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

(01) වුවමනාවල දැකිය හැකි ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,
(1) පොදුවීම, සීමිත වීම සහ නිර්මාණය කළ හැකි වීම.
(2) අසීමිත වීම, පොදු වීම, උත්පත්තිය සමග ඇති වීම.
(3) ප්‍රාථමික වීම, පුද්ගල බද්ධ වීම සහ විවිධ වීම.
(4) විවිධ වීම, අසීමිත වීම සහ නිර්මාණය කළ හැකි වීම.
(5) සීමිත වීම, ද්විතියික වීම සහ පුද්ගල බද්ධ වීම.

(02)



| | A | B | C | D |
|---|---|---|---|---|
| (1) | A- කර්මාන්ත | B- නිශ්කර්ෂක කර්මාන්ත | C- නිර්මාණ කර්මාන්ත | D- වෙළඳාම |
| (2) | A- ප්‍රාථමික | B- කෘෂිකාර්මික | C- කාර්මික | D- දේශීය වෙළඳාම |
| (3) | A- කර්මාන්ත | B- කාර්මික | C- කෘෂිකාර්මික | D- දේශීය වෙළඳාම |
| (4) | A- වෙළඳාම | B- කාර්මික | C- කෘෂිකාර්මික | D- විදේශීය වෙළඳාම |
| (5) | A- කර්මාන්ත | B- නිශ්කර්ෂක කර්මාන්ත | C- වෙළඳාම | D- නිර්මාණ කර්මාන්ත |

(03) ව්‍යාපාරයක් සාර්ථක වේ යැයි පවසන්නේ පහත කරුණු අතුරින් කුමක් ඉටු වූ විටද?
(1) ව්‍යාපාරයට ඉහළ කීර්ති නාමයක් හිමිවීම.
(2) ව්‍යාපාරය ඉතා ඉහළ ලාභයක් ලැබීම.
(3) ව්‍යාපාරය සමාජ වගකීම් ඉටු කිරීම.
(4) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ගේ අපේක්ෂාවන් ඉටුවීම.
(5) ව්‍යාපාරයේ ප්‍රවර්ධන ක්‍රම සාර්ථක වීම.

(04) ස්වයංපෝෂිත ක්‍රමය බිඳ වැටීමත් සමග හුවමාරුව ඇතිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳාම බිහිවිය. වෙළඳාමක් ඇතිවීම සඳහා එක විට පැවතිය යුතු ගුණාංග වන්නේ,

A- ගැනුම්කරුවන් සිටීම.

B- මුදල් පැවතීම.

C- වටිනාකමක් සහිත දෙයක් දෙපාර්ශ්වය අතර හුවමාරු වීම.

D- විකුණුම්කරුවන් සිටීම.

E- භෞතික වෙළෙඳපොළක් පැවතීම අනිවාර්යය වීම.

F- ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර එකඟතාවයක් වීම.

නිවැරදි පිළිතුර සහිත කාණ්ඩය වන්නේ,

(1) ACDE (2) ABCF (3) ABDF (4) ACDF (5) ABDE

(05) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව හා ඔවුන්ගේ අපේක්ෂාවෙන් පහත දැක්වේ.

| | ඇල්මැති පාර්ශව | | අපේක්ෂාවන් |
|---|---|---|---|
| A | අයිතිකරුවන් | 1) | බදු අය කිරීම. |
| B | රජය | 2) | සාධාරණ මිලට භාණ්ඩ මිලදී ගැනීම. |
| C | සේවකයන් | 3) | ලාභ ලැබීම. |
| D | පාරිභෝගිකයන් | 4) | ඉහළ වැටුප් ලැබීම. |

නිවැරදි කාණ්ඩය වන්නේ,

(1) A-3, B-1, C-4, D-2 (2) A-1, B-2, C-3, D-4

(3) A-2, B-1, C-3, D-4 (4) A-4, B-1, C-3, D-2

(5) A-3, B-1, C-2, D-4

(06) පහත වගුවේ දැක්වෙන්නේ "සාරාගේ" ව්‍යාපාරයේ කටයුතු සඳහා බලපාන ආසන්න පරිසර බලවේග හා අවස්ථාවන් ය.

| | ආසන්න බලවේග | | අවස්ථාවන් |
|---|---|---|---|
| A | ගනුදෙනුකරුවන් | 1) | ආදේශන භාණ්ඩ කුඩා ප්‍රමාණයක් පැවතීම. |
| B | තරගකරුවන් | 2) | වට්ටම් ලබාදීම. |
| C | සැපයුම්කරුවන් | 3) | කුඩා ප්‍රවර්ධනයක් තිබීම. |
| D | ආදේශන භාණ්ඩ නිපදවන්නන් | 4) | ක්‍රය ශක්තිය වැඩි වීම. |

නිවැරදි කාණ්ඩය වන්නේ,

(1) A-4, B-3, C-2, D-1 (2) A-3, B-2, C-1, D-4

(3) A-2, B-1, C-3, D-4 (4) A-1, B-2, C-3, D-4

(5) A-3, B-1, C-4, D-2

(07) අභ්‍යන්තර පරිසරයට පමණක් අයත් කාණ්ඩය තෝරන්න:

(1) තරගකරුවන්, අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයන්

(2) අයිතිකරුවන්, සේවකයන්, සංවිධාන සංස්කෘතිය, කළමනාකරුවන්

(3) පාරිභෝගිකයන්, සේවකයන්, අයිතිකරුවන්, කළමනාකරුවන්

(4) අයිතිකරුවන්, සේවකයන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්

(5) අයිතිකරුවන්, සංවිධාන සංස්කෘතිය, සේවකයන්, ගනුදෙනුකරුවන්

(08) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - සාර්ව පරිසර බලවේග, අන්තර් සම්බන්ධතාවයකින් යුක්තය.

B - විභව ව්‍යාපාරිකයින්, ආදේශන නිෂ්පාදිත නිපදවන්නන්, ආසන්න පරිසර බලවේගයන් ය.

C - බාහිර පරිසර බලවේග හා ආසන්න පරිසර බලවේග වල එකතුව සාර්ව පරිසරයකි.

D - අභ්‍යන්තර පරිසරය ව්‍යාපාරයට පාලනය කරගත නොහැක.

E - තරගකරුවන්, සැපයුම්කරුවන් සහ වෙළඳපොළට පිවිසීමට අපේක්ෂිත නව ව්‍යාපාරිකයින් හරහා ව්‍යාපාර වලට තර්ජන මෙන් අවස්ථා ඇති කරයි.

පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,

(1) A, C, E (2) A, B, C (3) A, C, D (4) A, B, E (5) B, C, E

(09) "සීමාසහිත ගිගී තේ කොළ සමාගම" ගංවතුරෙන් අනාථ වූ කැලණිමුල්ල ප්‍රදේශයේ ජනතාවට වියළි ආහාර මල්ලක් බෙදා දුන් අතර එහි තිබූ තම ආයතනයේ සේවකයන් සඳහා වෛද්‍ය සායනයක් පැවැත්විය. සමාගම විසින් ඉටු කරන ලද්දේ,

(1) ආයෝජකයින්ට හා සේවකයන්ට අදාළ සමාජ වගකීම්

(2) සමාජයට හා පරිසරයට අදාළ සමාජ වගකීම්

(3) ආයෝජකයින්ට හා සමාජයට අදාළ සමාජ වගකීම්

(4) සමාජයට හා සේවකයින්ට අදාළ සමාජ වගකීම්

(5) ආයෝජකයින්ට හා ගනුදෙනුකරුවන්ට අදාළ සමාජ වගකීම් ය.

(10) ව්‍යාපාර ආචාර්ධර්ම සංග්‍රහයක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - තරගකරුවන් B - ගනුදෙනුකරුවන් C - විනිවිදභාවය

D - සංවිධාන සංස්කෘතිය E - ආගමික පරිසරය

පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,

(1) A, B, C (2) A, B, D (3) A, C, E (4) B, C, E (5) B, E, D

(11) මූල්‍ය සහ ගිණුම්කරණයට අදාළ ආචාර ධර්මයකි.

(1) සේවකයින්ට අසාධාරණ ලෙස නොසැලකීම.

(2) අනවශ්‍ය අධික වියදම් ගෙවීම් පිටු දැකීම.

(3) වෙළඳ ලකුණු වංචනික ලෙස යොදා නොගැනීම.

(4) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ප්‍රමිතියට සිදුකිරීම.

(5) පරිසරයට හානි නොවන ලෙස කටයුතු කිරීම.

(12) පහත ප්‍රකාශ අතුරින් ෆිස්කල් ප්‍රතිපත්තිය සම්බන්ධ ප්‍රකාශය වන්නේ,

(1) මුදල් සැපයුම වැඩි කිරීම.

(2) පොලී අනුපාතය ඉහළ තැබීම.

(3) රජයේ වර්තන වියදම් අඩු කිරීම.

(4) යහපෙළඹවීම් ඇති කිරීම.

(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාත පහත හෙලීම.

(13) රජය ව්‍යාපාර වෙනුවෙන් විවිධ පහසුකම් සලසන අතර ව්‍යාපාර විසින් ද රජයේ අරමුණු ඉටුකර ගැනීමට දායක විය යුතුය. එසේ දායක විය යුතු ආකාරය දැක්වෙන නිවැරදි කාණ්ඩය වන්නේ,

(1) රජයට බදු ගෙවීම, සේවා නියුක්තියට දායක වීම, යටිතල පහසුකම් සැපයීම.

(2) රජයට බදු ගෙවීම, සේවා නියුක්තියට දායක වීම, පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම.

(3) රජයට බදු ගෙවීම, නිතිරීති පිළිපැදීම, භාණ්ඩ ආනයනය කිරීම.

(4) දේශීය සම්පත් භාවිතය, විදේශ විනිමය ගනුදෙනු, භාණ්ඩ අලෙවි කිරීම.

(5) සේවා නියුක්තියට දායක වීම, ප්‍රාදේශීය සම්පත් භාවිතය, භාණ්ඩ අපනයනය

(14) පහත වගුවේ X තීරුවේ ජාත්‍යන්තර ප්‍රමිති කිපයක් ද, Y තීරුවෙන් නියෝජනය වන ක්ෂේත්‍ර ද දැක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| A | ISO : 26000 | 1) | තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහ සහතිකකරණය. |
| B | ISO : 27000 | 2) | වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය |
| C | ISO : 14001 | 3) | සමාජ වගකීම් පද්ධති සහතිකකරණය |
| D | OHSAS : 26000 | 4) | පරිසර සංරක්ෂණ පද්ධති සහතිකකරණය |

X හා Y නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) A-3, B-1, C-4, D-2
(2) A-1, B-2, C-4, D-3
(3) A-2, B-3, C-4, D-1
(4) A-4, B-3, C-2, D-1
(5) A-2, B-1, C-3, D-4

(15) භාණ්ඩ විකිණීමේ දී ගැනුම්කරු වෙත ඉදිරිපත් කළ හැකි කොන්දේසියක් වන්නේ,
(1) මිලදී ගත් පසු භාණ්ඩ ආපසු භාර නොගනී යන්නය.
(2) වරකට භාණ්ඩ දෙක බැගින් මිලට ගත යුතුය යන්නය.
(3) භාණ්ඩයේ මිල නොපමාවම ගෙවිය යුතුය යන්නය.
(4) චෙක්පත් වලින් පමණක් ගෙවිය යුතුය යන්නය.
(5) මාසයකට පමණක් වගකීම් සහතික නිකුත් කරන බවය.

(16) ඒකල ස්වාමි ව්‍යාපාරයකට හා හවුල් ව්‍යාපාරයකට අදාළ පොදු ලක්ෂණ අඩංගු පිළිතුර වන්නේ,
(1) ලාභ ලැබීම, නීතිමය පුද්ගල භාවයක් නොමැති වීම, අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(2) අඛණ්ඩ පැවැත්මක් තිබීම, ලාභය බෙදී යාම, නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම.
(3) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්යය නොවීම, වගකීම් සීමිත වීම, අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(4) සමාජ සුභසාධනය, නීතිමය පුද්ගලභාවයක් තිබීම, අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(5) ලාභ ලැබීම, අඛණ්ඩ පැවැත්ම, වගකීම් සීමිත වීම.

(17) පහත වගුවෙහි සමාගම් කිපයක් හා ඒවායේ ලක්ෂණ කිහිපයක් දක්වා ඇත.

| | X | | Y |
|---|---|---|---|
| A | අක්වෙරළ සමාගම් | (අ) | කොටස් ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළ හැකි සමාගමකි. |
| B | අනේවාසික සමාගම් | (ආ) | වෙළඳාම වාණිජ්‍ය හෝ කලාව දියුණු කිරීමට අරඹයි. |
| C | ඇපයෙන් සීමිත සමාගම් | (ඇ) | මෙරට ලියාපදිංචි කර වෙනත් රටක ව්‍යාපාර කටයුතු කරයි. |
| D | පුණ්‍ය සමාගම් | (ඉ) | වෙනත් රටක සංස්ථාගත කර මෙරට ව්‍යාපාර කටයුතු සිදුකරන සමාගම් ය. |

ගැළපෙන කාණ්ඩය තෝරන්න.

(1) A - අ, B – ඉ, C - ආ, D – ඇ
(2) A - ඇ, B – ඉ, C - අ, D - ආ
(3) A - අ, B – ආ, C - ඇ, D - ඉ
(4) A - ඉ, B – ඇ, C - ආ, D - අ
(5) A - ඇ, B – අ, C - ඉ, D - ආ

(18) පහත තොරතුරු සමුපාකාර ව්‍යාපාරයට අදාළ වේ.

A - විවෘත බව
B - ස්වයං උපකාරය
C - සමාජ වගකීම්
D - සමිති අතර සහයෝගය
E – සමානාත්මතාව
F - ස්වයං වගකීම
G - අවංක බව
H - ප්‍රජාතන්ත්‍රවාදී බව

ඉහත සාධක අතරින් සමුපාකාර ව්‍යාපාරයට ආවේණික අගනාකම් වන්නේ,

(1) A B F H
(2) A B D H
(3) B E F H
(4) AC D H
(5) C B D G

(19) පහත දැක්වෙන ව්‍යාපාරිකයින් අතරින් ව්‍යවසායකයින් ලෙස සැලකිය හැක්කේ,

(1) කුඩා පරිමාණයේ සිල්ලර වෙළඳසැලක් ආරම්භ කරන්නෙක්
(2) සීමාසහිත සමාගමක කොටස් මිලදී ගැනීමේ හා විකිණීමේ යෙදී සිටින්නෙක්
(3) සමපේක්ෂණ කටයුතු සඳහා ආයෝජනය කරන්නෙකි.
(4) නව නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දෙන්නෙකි.
(5) ඉහත සියල්ලම

(20) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ අදියර පිළිවෙලින් දැක්වෙනුයේ,

(1) අදහස් උත්පාදනය → ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම → නව්‍යතා සම්පාදනය → ක්‍රියාවට නැංවීම.
(2) අදහස් උත්පාදනය → නව්‍යතා සම්පාදනය → ක්‍රියාත්මක කිරීම → වර්ධනය
(3) නව්‍යයතා සම්පාදනය → ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම → ක්‍රියාත්මක කිරීම → වර්ධනය
(4) අදහස් උත්පාදනය → ක්‍රියාත්මක කිරීම → නව්‍යතා සම්පාදනය → වර්ධනය
(5) නව්‍යතා සම්පාදනය → ක්‍රියාත්මක කිරීම → ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම → වර්ධනය

(21) ව්‍යවසායකත්වයට එරෙහි සාධකයකි,

(1) පුද්ගල හැකිම් (2) අත්දැකීම් (3) මනෝවිහිතිය
(4) සේවක ගැටුම් (5) අධ්‍යාපනය නොලැබීම.

(22) යුරෝ මුදල් භාවිත නොකරන යුරෝපීය රටකි.

(1) ඉතාලිය (2) බෙල්ජියම (3) ප්‍රංශය
(4) ඩෙන්මාර්කය (5) එංගලන්තය

(23) පහත දැක්වෙන්නේ රටවල් කිහිපයක භාවිත කරන මුදල් වර්ග ලැයිස්තුවකි,

| | රට | | මුදල් වර්ගය |
|---|---|---|---|
| A | ප්‍රංශය | (1) | වොන් |
| B | ජපානය | (2) | රින්ගිට් |
| C | මැලේසියාව | (3) | යුරෝ |
| D | දකුණු කොරියාව | (4) | යෙන් |

එක් එක් රටෙහි භාවිත වන මුදල් වර්ග නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-2, C-3, D-4 (2) A-3, B-4, C-2, D-1
(3) A-2, B-1, C-3, D-4 (4) A-4, B-1, C-2, D-3
(5) A-3, B-4, C-1, D-2

(24) හොඳ මුදලක ලක්ෂණ හා කාර්ය කිහිපයක් දැක්වේ.

A - කුඩා ඒකක වලට බෙදිය හැකි බව B - වටිනාකමේ මිම්මක් වීම.
C - පොදු පිළිගැනීම. D - විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම.
E - හුවමාරු මාධ්‍යයක් වීම. F - කල්පැවැත්ම

මුදලේ කාර්යය පමණක් ඇතුළත් කාණ්ඩය වනුයේ,

(1) A,B සහ D ය. (2) A,D සහ E ය. (3) B,C සහ D ය.
(4) B,D සහ E ය. (5) C,D සහ F ය.

(25) යම් පුද්ගලයෙකුට ණයපතක් ලබා ගැනීම සඳහා වඩා වැදගත්ම සුදුසුකම වන්නේ,

(1) බැංකුවේ ජංගම ගිණුමක් තිබීම.

(2) ප්‍රමාණවත් වත්කම් පැවතීම.

(3) සුරැකුම් ඉදිරිපත් කළ හැකි බව

(4) ස්ථිර ආදායම් මාර්ගයක් තිබීම.

(5) ගනුදෙනු සම්බන්ධ වංචනික ක්‍රියා වාර්තා වී නොතිබීම.

(26) ගනුදෙනු කළ නොහැකිය.

ඉහත රේඛනයෙන් අදහස් වන්නේ,

(1) එය ගනුදෙනු කළ නොහැකි චෙක්පතකි.

(2) එම චෙක්පත පිටසන් කර අන් අයෙකුට පැවරිය නොහැකිය.

(3) පැවරුම්ලාභියාට හොඳ හිමිකමක් නොලැබේ.

(4) පවරන්නාට වඩා හොඳ හිමිකමක් පැවරුම්ලාභියාට ලැබේ.

(5) පවරන්නාට තිබෙන හිමිකමම පැවරුම්ලාභියාට ලැබේ.

(27) රක්ෂණය කළ හැකි අවදානමක් ලෙස පිළිගැනීමට භාවිතා කරන නිර්ණායකයක් නොවන සාධකය තෝරන්න.

(1) සම්බන්ධතාවයෙන් තොරවීම.

(2) අදාළ අවදානම වළක්වා ගත හැකිවීම.

(3) අවදානම අහඹු ලෙස සිදුවීම.

(4) සත්‍යාපනය කළ හැකිවීම.

(5) ආවරණය කරනු ලැබූ හේතුවකින් සිදුවීම.

(28) ප්‍රවාහන පද්ධතියක මූලිකාංග පමණක් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) මහාමාර්ග (2) මාර්ගය (3) මිනිස් ශ්‍රමය (4) පර්යන්තය

(5) මාධ්‍ය (6) වාතය (7) බලය (8) විදුලිය

(9) හිරු එළිය

(1) 1, 2, 3, 4 (2) 1, 2, 5, 6 (3) 2, 5, 7, 9

(4) 2, 4, 5, 7 (5) 4, 5, 6, 8

(29) සිරිමල් කලිසම් 6 ක් සුමනසිරිගෙන් මිලට ගෙන අවුරුදු සමයේ අමල් ට හා කමල් ට කලිසම් 3 බැගින් විකුණන ලදී. මේ අනුව මෙහි තොග වෙළෙන්දා හා සිල්ලර වෙළෙන්දා පිළිවෙලින්,

(1) සිරිමල් හා කමල් ය. (2) සුමනසිරි හා කමල් ය.

(3) අමල් හා කමල් ය. (4) සුමනසිරි හා සිරිමල් ය.

(5) සිරිමල් හා අමල් ය.

(30) අපනයනකරු විසින් දූෂ්‍ය නෞභාරපතක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම සඳහා නැව් සමාගමට ඉදිරිපත් කරනුයේ,

The National e-Learning Portal for The General Education

**ප්‍රශ්න අංක. 31 සිට 40 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(31) නිෂ්පාදිත .................................. අනුව භාණ්ඩ හා සේවා වශයෙන් වර්ග කළ හැකි අතර නිතර නිතර භාවිත කරන භාණ්ඩ .............................................. ලෙස හැඳින්වේ.

(32) ව්‍යාපාරයක අයිතිකරුවන් .............................................. නිසා ව්‍යාපාරයට ඇල්ම දක්වන අතර ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා දෙන නිසා .............................................. ඇල්ම දක්වයි.

(33) රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය .............................................. හා සෘජුවම සම්බන්ධ වන අතර .............................................. .............................................. ෆිස්කල් ප්‍රතිපත්තිය මගින් නිරූපණය වේ.

(34) නෛතික පුද්ගල භාවයට අමතරව සමාගම් වල දැකිය හැකි නීතිමය ලක්ෂණ දෙකක් වන්නේ .............................................. .............................................. හා .............................................. වේ.

(35) ව්‍යවසායකත්වය කෙරෙහි බලපාන පුද්ගල සාධක ලෙස (1) .............................................. හා (2) .............................................. හඳුනා ගත හැකිය.

(36) ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට සේවා සපයනු ලබන ආයතන අතුරෙන් SMED සහ කෙටි යෙදුමෙන් .............................................. හඳුන්වන වන අතර BOC යන කෙටි යෙදුමෙන් .............................................. හඳුන්වයි.

(37) ශ්‍රී ලංකාවේ විශේෂිත මූල්‍ය ආයතන දෙකක් ලෙස .............................................. සහ .............................................. දැක්විය හැක.

(38) සවලදායි පණිවුඩයක් සැකසීමේ දී .............................................. හා .............................................. .............................................. කෙරෙහි සැලිකිලිමත් විය යුතුය.

(39) රක්ෂණයට බලපාන මූල ධර්ම දෙකක් වන්නේ (1) .............................................. (2) .............................................. ය.

(40) විදේශ වෙළඳාම සිදුවන ප්‍රධාන ආකාර දෙක වන්නේ, (1) .............................................. (2) .............................................. ය.

**ප්‍රශ්න අංක. 41 සිට 50 දක්වා නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) පාරිභෝගික වගකීම් හතරක් දක්වන්න.

(1) .............................................. (2) ..............................................

(3) .............................................. (4) ..............................................

(42) සමාගමක් ආරම්භයේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි කවරේද?

(1) .............................................. (2) ..............................................

(3) .............................................. (4) ..............................................

(43) ව්‍යවසායකත්වය කෙරෙහි බලපාන සමාජයීය සාධක හා පාරිසරික සාධක දෙක බැගින් දක්වන්න.

| සමාජයීය සාධක | පාරිසරික සාධක |
|---|---|
| (1) .............................................. | (1) .............................................. |
| (2) .............................................. | (2) .............................................. |

(44) කුඩා ව්‍යාපාර සඳහා විවිධ ආයතන වලින් ලබාදෙන සේවා හතරක් දක්වන්න.

(1) .............................................. (2) ..............................................

(3) .............................................. (4) ..............................................

(45) (අ) ගිවිසුම් ගත ඉතිරිකිරීමේ ආයතන දෙකක් ලියන්න.

(1) ..............................

(2) ..............................

(ආ) හරපතක් භාවිතයේ වාසි දෙකක් ලියන්න.

(1) ..............................

(2) ..............................

(46) රක්ෂණයේ අවදානම් හතරක් ලියන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(47) සන්නිවේදනයේ මූලිකාංග කවරේද?

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(48) සන්නිවේදනයට බාධා පමුණුවන සාධක හතරක් ලියන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(49) සිල්ලර වෙළඳාමෙන් තොග වෙළඳාම වෙනස්වන ආකාර හතරක් ලියන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(50) පහත සඳහන් කෙටි වචන වල අර්ථය ලියන්න.

(1) WTO (2) IMF (3) EU (4) SAARC

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය
Grade 12

පැය තුනයි.
Three hours

# ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය
# Business Studies - Paper II

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (i) "ලාභ ලැබීමේ පරමාර්ථයෙන් යුතු ව්‍යාපාරයක් වඩා සාර්ථක වන්නේ එය ඉහළ ලාභයක් උපයන්නේ නම් ය."

(අ) ව්‍යාපාරයක ලාභය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) ව්‍යාපාරයකට ලාභය මෙතරම් වැදගත් වන්නේ ඇයි? ආදායම හා ලාභය අතර වෙනස කුමක් ද? (ලකුණු 4)

(ii) (අ) ව්‍යාපාරයක ප්‍රධාන කාර්යයන් නම් කර පැහැදිලි කරන්න.

(ආ) පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) නිෂ්පාදනය (ii) නිෂ්පාදිතය

(iii) ඉල්ලුම (iv) භාණ්ඩ හා සේවා (ලකුණු 4)

(iii) (අ) "ව්‍යාපාරයක මූලික පරමාර්ථය ඇල්මැති පාර්ශ්ව තෘප්තිමත් කිරීමයි. නමුත් මෙම ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු එකිනෙකට ගැටෙන සුළුය." ඔබ එය පැහැදිලි කරන්නේ කෙසේද?

(ආ) ව්‍යාපාර ඇල්මැති පාර්ශ්ව කෙරෙහි සැලකිලිමත් වන්නේ ඔවුන්ගෙන් ව්‍යාපාර වලට ද යම් යම් ප්‍රතිලාභ අත්වන නිසාය. ව්‍යාපාරවලට ඇල්මැති පාර්ශ්වයන්ගෙන් ලැබෙන දායකත්වය කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) "ව්‍යාපාරයකට බලපාන සාර්ව පරිසරය ගතිකය. මේ නිසා ව්‍යාපාරිකයින් ඒ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වයි."

(අ) ව්‍යාපාර කෙරෙහි බලපාන සාර්ව පරිසර බලවේග වල බලපෑම අන්තර් සබඳතාවකින් යුක්තය. පැහැදිලි කරන්න.

(ආ) පහත දැක්වෙන සිදුවීම් ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

(i) කැලණි ගඟ පිටාර යාමෙන් ඇතිවූ ගංවතුර

(ii) සාලාව ප්‍රදේශයේ ඇතිවූ යුද අවි ගබඩාව පිපිරීම. (ලකුණු 4)

(v) (අ) "අභ්‍යන්තර පරිසරය ව්‍යාපාරයකට මුළුමනින්ම පාලනය කළ හැකි පරිසරයයි." එම පරිසරය තුළින් පැන නඟින ශක්තීන් හා දුර්වලතා දෙක බැගින් උදාහරණ සහිතව දක්වන්න.

(ආ) ආසන්න පරිසරය ව්‍යාපාරයකට යම් තාක් දුරකට පාලනය කළ හැකිය. නමුත් එය මුළුමනින්ම පාලනය කළ නොහැකිය. එම පරිසරය තුළින් පැන නඟින අවස්ථා හා තර්ජන දෙක බැගින් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 4)

(02) (i) (අ) "සමාජ වගකීම් ඉටු කිරීමට ව්‍යාපාර වලට තම ලාභයෙන් කොටසක් කැප කිරීමට සිදුවේ." මේ නිසා සමාජ වගකීම් ඉටු නොකර ව්‍යාපාර ලාභය ඉහළ නංවා ගැනීමට ඇතැම් ව්‍යාපාරිකයින් උනන්දු විය හැකියි. මෙහි දක්නට ලැබෙන ප්‍රතිවිපාක කවරේද?

(ආ) "සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ කවරේද?" (ලකුණු 4)

(ii) (අ) "කිසියම් ව්‍යාපාරයක් ආචාරධර්ම රැකීමෙන් එම ව්‍යාපාරයට පමණක් නොව මුළු මහත් සමාජයටම ප්‍රතිලාභ අත්වේ." පැහැදිලි කරන්න.

(ආ) "ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහයක් සැකසීමේ දී සේවකයින් හා ගනුදෙනුකරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු යැයි එක් ව්‍යාපාරිකයෙකු ප්‍රකාශ කරන ලදී." එම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) රජය විසින් පැනවීමට යෝජිත එකතු කළ අගය මත බද්දේ ප්‍රතිශතය කොපමණ ද? ඉන් පාරිභෝගිකයාට සිදුවන බලපෑම කුමක් ද?

(ආ) පහත සඳහන් ආර්ථික අරමුණු විස්තර කරන්න.

(1) ආර්ථික වෘද්ධිය (2) සාධාරණ ආදායම් ව්‍යාප්තිය

(3) පූර්ණ සේවා නියුක්තිය (4) පාරිසරික ගුණාත්මක භාවය (ලකුණු 4)

(iv) (අ) බදු විතැන් කිරීමේ හැකියාව මත හා බදු ප්‍රතිශත මත බදු වර්ග කර දක්වන්නේ කෙසේද? උදාහරණ දෙන්න.

(ආ) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජය යොදා ගන්නා ප්‍රධාන උපකරණ කෙමරේද? (ලකුණු 4)

(v) (අ) පාරිභෝගික අයිතිවාසිකම් ඉබේ සුරැකෙන්නේ නැත. ඒ සඳහා පාරිභෝගිකයින් කෙසේ ක්‍රියා කළ යුතු ද ?

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරනු ලබන පහත ආකාර දෙක පැහැදිලි කරන්න.

(1) ස්වෙච්ඡාවෙන් පිළිපැදීම. (2) සහතික ලාංඡන ක්‍රමය (ලකුණු 4)

(03) (i) පහත සාධක ඇසුරෙන් හවුල් ව්‍යාපාරයක් හා සීමාසහිත පෞද්ගලික සමාගමක් අතර වෙනස පැහැදිලි කරන්න.

(අ) වගකීම (ආ) නෛතික පුද්ගලභාවය

(ඉ) පැවැත්ම (ඊ) ලියාපදිංචිය (ලකුණු 4)

(ii) (අ) සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය හා හවුල් ව්‍යාපාරයක ව්‍යවස්ථාවලිය අතර වෙනස දක්වන්න.

(ආ) කොටස් බලපත්‍රය හා කොටස් සහතිකය වෙන් වෙන්ව දක්වන්න. (ලකුණු 4)

(iii) (අ) වරලත් ව්‍යාපාරයක් ඇරඹිය හැකි ප්‍රධාන ක්‍රම මොනවාද?

(ආ) වරලත් ව්‍යාපාරයක් ඇරඹීමෙන් වරලත් ලාභියෙකුට හිමිවන ප්‍රතිලාභ කවරේද? (ලකුණු 4)

(iv) (අ) "සමුපකාර සමිතියක සාර්ථකත්වය තීරණය වන්නේ එහි ගනුදෙනුකරුවන්ගේ කැපවීම මතය." පැහැදිලි කරන්න.

(ආ) සමුපකාර සමිතියක් ලියාපදිංචියට අවශ්‍ය ලියකියවිලි කවරේද? (ලකුණු 4)

(v) (අ) "රාජ්‍ය සංස්ථා ආකාර්යක්ෂම බැවින් ඒ වෙනුවට රාජ්‍ය සමාගම් අරඹනු දක්නට ලැබේ." රාජ්‍ය සංස්ථාවලට සාපේක්ෂව රාජ්‍ය සමාගම් වල දක්නට ලැබෙන වාසි කවරේද?

(ආ) "රජයේ දෙපාර්තමේන්තුවක් හා රාජ්‍ය සංස්ථාවක් සසඳන්න. (ලකුණු 4)

(04) (i) (අ) "දක්ෂ ව්‍යවසායකයන් තමන්ට ලැබෙන ඕනෑම අවදානමක් භාරගනී." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද පැහැදිලි කරන්න.

(ආ) "සාර්ථක ව්‍යවසායකයෙක් වීමට අවශ්‍ය වන්නේ පළපුරුද්ද පමණි." ඔබ මෙම ප්‍රකාශයට එකඟ ද පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) "ව්‍යවසායකයන් රටකට අවශ්‍ය වන්නේ සේවා නියුක්තිය ඉහළ නැංවීමටයි." පැහැදිලි කරන්න.

(ආ) ව්‍යවසායකන් බිහි වන්නේ උපතින් ද, අධ්‍යාපනයෙන් ද පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) කුඩා ව්‍යාපාරයක ලක්ෂණ එහි නිර්වචනය ඇසුරින් පැහැදිලි කරන්න.

(ආ) කුඩා ව්‍යාපාරයක් අසාර්ථක වීමට බලපාන සාධක කවරේද? (ලකුණු 4)

(iv) (අ) කුඩා ව්‍යාපාර වර්ගීකරණය කිරීම සඳහා යොදා ගන්නා පදනම් කවරේද?

(ආ) කුඩා ව්‍යාපාර ආර්ථිකයට වැදගත් වන්නේ ඇයි? (ලකුණු 4)

(v) (අ) පසුගිය දා සිදුවූ ගංවතුරෙන් හා යුද හමුදා කඳවුර විනාශ වීමෙන් කුඩා ව්‍යාපාර වලට සහනයක් සැලසීමට රජයට ගත හැකි ක්‍රියා මාර්ග කවරේද?

(ආ) "ව්‍යවසායකයන්ගේ උපත කුඩා ව්‍යාපාරයි." පැහැදිලි කරන්න. (ලකුණු 4)

(05) (i) (අ) "මුදල් වල ප්‍රධාන කාර්ය භාරය වන්නේ හුවමාරු ක්‍රියාවලියේ අතරමැදියෙකු ලෙස ක්‍රියාකිරීමයි." ඔබ ඊට එකඟවන්නේ ද ඔබ දන්නා වෙනත් කාර්යයන් තිබේද?

(ආ) වලංගු මුදල්, ආදේශන මුදල්, බැංකු මුදල්, ආසන්න මුදල් හඳුන්වන්න. (ලකුණු 4)

(ii) (අ) මුදල් වෙනත් වත්කම් වලින් වෙනස්වන ප්‍රධාන සාධකය කුමක් ද?

(ආ) හොඳ මුදලක පැවතිය යුතු ලක්ෂණ කවරේද?

(ඉ) මුදල් වලින් ධනය රැස්කර තබා ගන්නවාට වඩා මිනිසුන් වටිනා ද්‍රව්‍ය වලින් වත්කම් එක්රැස් කර තබා ගැනීමට පෙළඹෙන්නේ කුමන විටකද?

(ඊ) ලංකාවේ භාවිත වන කාසි හා නෝට්ටු වර්ග සංඛ්‍යාව කොපමණ ද? වෙන් වෙන්ව දක්වන්න. (ලකුණු 4)

(iii) බලපත්‍රලාභි වාණිජ බැංකුවක් හා බලපත්‍රලාභි විශේෂිත බැංකුවක් සසඳන්න. (ලකුණු 4)

(iv) (අ) ප්‍රධාන කල්බදු වර්ග කවරේද?

(ආ) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් හා වණික් බැංකු වල ලක්ෂණ කවරේද? (ලකුණු 4)

(v) (අ)

| A | B |
|---|---|
| ගනුදෙනු කළ නොහැක. | ආදායකයාගේ ගිණුමට පමණයි.<br>ලංකා බැංකුව - මහරගම. |

ඉහත රේඛන සහිත චෙක්පත් දෙක අතුරින් තවදුරටත් ගනුදෙනු කළ නොහැක්කේ කවර අක්ෂර මගින් දක්වන චෙක්පත ද පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ආ) පහත සංකල්ප හඳුන්වන්න.

(1) විධාන චෙක්පත් හා ධාරක චෙක්පත්

(2) වලංගු චෙක්පත් හා අවිධිමත් චෙක්පත් (ලකුණු 4)

(06) (i) (අ) රක්ෂණ මූලධර්ම කවරේද?

(ආ) උපරිම විශ්වාසය නැමැති මූලධර්ම කඩවීම නොසලකා හැර රක්ෂිතයාට වන්දි ගෙවන අවස්ථා කවරේද? (ලකුණු 4)

(ii) (අ) ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් පවාරන අගය ලබා ගැනීම හා ගෙවා නිමි ඔප්පුවක් බවට පත් කිරීම අතර පවතින වෙනස කවරේද?

(ආ) රක්ෂණ හිමිකම සම්බන්ධයෙන් ජීවිත රක්ෂණය, ගිනි රක්ෂණය හා නාවික රක්ෂණයේ දී දක්නට ලැබෙන වෙනස්කම් කවරේද? (ලකුණු 4)

(iii) (අ) "නැව් කඳ රක්ෂණය හා නැව් බඩු රක්ෂණය" අතර ඔබ දකින වෙනස් කුමක් ද?

(ආ) "ගිනි රක්ෂණයෙන් ආවරණය කරන්නේ ගිනි හානි පමණක් නොවේ." පැහැදිලි කරන්න.(ලකුණු 4)

(vi) (අ) වගකීම් රක්ෂණය යනු කුමක් ද?

(ආ) වෘත්තීය වගකීම් රක්ෂණය යනු කුමක් ද? (ලකුණු 4)

(v) (අ) රක්ෂණය සූදු ක්‍රීඩාවෙන් වෙනස් වන්නේ කෙසේද?

(ආ) පහත සංකල්ප හඳුන්වන්න.

(1) ප්‍රති රක්ෂණය (2) ප්‍රාරක්ෂණය (ලකුණු 4)

(07) (i) (අ) කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග කවරේද?

(ආ) ප්‍රවාහනයේ නව ප්‍රවනතා කවරේද? (ලකුණු 4)

(ii) ප්‍රවාහනයේ මූලිකාංග ඇසුරින් ලංකාවේ ප්‍රවාහන ක්‍රමයේ දක්නට ලැබෙන දුර්වලතා කවරේද? (ලකුණු 4)

(iii) (අ) මහාමාර්ග ප්‍රවාහනයේ දක්නට ලැබෙන වාසි අවාසි හතර බැගින් දක්වන්න.

(ආ) ලංකාවේ බිහිවී ඇති අධිවේගී මාර්ග නම් කරන්න. එමගින් ආර්ථිකයට අත්වන වාසි කවරේද?

(iv) "ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල අධික වාහන තදබදයක් දක්නට ලැබේ." එම ප්‍රශ්නය විසඳීමට ඔබ යෝජනා කරන්නේ කුමක් ද? (ලකුණු 4)

(v) පහත දැක්වෙන අවස්ථා සඳහා සුදුසු වුවමනා ක්‍රමයක් යෝජනා කරන්න.

(අ) තායිලන්තයේ සිට ලංකාවට ඇතෙකු ප්‍රවාහනය

(ආ) නුවරඑළියේ සිට කොළඹට නැවුම් මල් ප්‍රවාහනයට

(ඇ) හම්බන්තොට සිට කොළඹට මෝටර් රථ තොගයක් ප්‍රවාහනයට

(ඉ) අනුරාධපුරයේ සිට කොළඹට රෝගියෙකු රැගෙන ඒමට (ලකුණු 4)

(08) (i) (අ) ඵලදායි සන්නිවේදනයක ගුණාංග දක්වන්න.

(ආ) ඵලදායි සන්නිවේදනයට ඇතිවන බාධා කවරේද? (ලකුණු 4)

(ii) (අ) පාසලක් යොදා ගන්නා ප්‍රධාන සන්නිවේදන ක්‍රම හතරක් දක්වන්න.

(ආ) "ඵලදායි සන්නිවේදනය සඳහා ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණය ඉතා වැදගත් සාධකයකි." පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) සිල්ලර හා තොග වෙළඳාම අතර වෙනස පැහැදිලි කරන්න.

(ආ) තොග වෙළෙන්දා නිසා වෙළඳාමට යහපතක් වේද? අයහපතක් වේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) විදේශ වෙළඳාමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල දක්වන්න.

(ආ) විදේශ වෙළඳාමට සම්බන්ධ වන පහත දැක්වෙන ආයතන හඳුන්වන්න.

(i) ලෝක වෙළඳ සංවිධානය (ii) සාර්ක් සංවිධානය

(iii) අපනයන සංවර්ධන මණ්ඩලය (iv) යුරෝපා සංගමය (ලකුණු 4)

***